## ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

(අ) 2012 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ යුතු නව ගිණුම්කරණ ප්‍රමිති සංස්ථාව අනුගමනය කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ වටිනාකම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ඇතුළත් කළයුතු වුවද එසේ දක්වා නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විකුණුම් රු.172,363 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) අමුද්‍රව්‍ය ගැණුම් වියදම රු.640,809 කින් වැඩිපුර දක්වා තිබුණි.

(ඇ) 2012 වර්ෂයේ ආර්ථික සේවා ගාස්තු වියදම රු.195,596 කින් වැඩිපුර දක්වා තිබුණි.

(ඈ) ණයවර ලිපි ආරක්ෂිත ආන්තික ගිණුමේ ශේෂය බැංකුවේ ශේෂයට වඩා රු.9,153 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2012 වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි ක්ෂය රු.1,177,639 ක් වුවද ස්ථාවර වත්කම් උපලේඛනයට සහ ක්ෂය ගිණුමට එය රු.294,555 ක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.883,084ක් අඩුවෙන්ද, වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඊ) සේවක ණය වටිනාකම වූ රු.16,538,848, සේවක ණය අත්තිකාරම් යටතේ දක්වා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී කලින් ගෙවීම් හා අත්තිකාරම් යටතේ එම වටිනාකම දක්වා තිබුණි.

1.2.3 **<u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාවට ලැබිය යුතු එකතුව රු.67,726,193 ක් වු ණයගැතියන් අතරින් අවුරුදු 02ට වඩා පැරණි ණයගැතියන්ගේ වටිනාකම රු.2,305,788 ක් විය.

(ආ) 2009 වර්ෂයේදී විදේශ තානාපති කාර්යාලයකට යවන ලද ඖෂධ වෙනුවෙන් රු.193,560 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

1.2.4 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

පහත සඳහන් විෂයයන් සඳහා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| පෙර වසර ගැලපුම් | 37,299,320 | උපලේඛන |
| නව පරිපාලන ගොඩනැගිල්ලේ පිරිවැය | 18,699,420 | උපලේඛන |
| ඉවත් කරන ලද ගොඩනැගිලි පිරිවැය | 6,863,355 | උපලේඛන |
| ඉවත් කරන ලද ගොඩනැගිලි වල ක්ෂය | 4,731,531 | |
| ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් ලැබියයුතු ණය | 1,246,419 | ශේෂ තහවුරු ලිපි |
| දකුණු පළාත් ආයුර්වේද කොමසාරිස්ගෙන් ලැබියයුතු ණය | 14,407 | |
| දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙන් ලැබියයුතු ණය | 265,597 | |

## 1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මු.රෙ. 169 | සෑම ගනුදෙනුකරුවෙකුටම මිලදීගත් ඖෂධ සඳහා බිල්පතක් නිකුත් කළ යුතු වුවද, අලෙවිසැල් 5 ක එසේ බිල්පත් නිකුත් කර නොතිබුණි. |
| (ii) | මු.රෙ. 772 | බත්තරමුල්ල හා විජේරාම අලෙවි සැල්වල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගන්නා ලද ප්‍රයෝජනයට ගත නොහැකි ඖෂධ 49 ක් අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වෙන්කළ වාහන දෙකක් සඳහා අනුමත ලීටර් ප්‍රමාණය ඉක්මවා පිළිවෙලින් ලීටර් 1264 ක් හා ලීටර් 406 ක් ලබාගෙන තිබුණු අතර, එහි වටිනාකම පිළිවෙලින් රු.106,230 ක් හා රු.55,654 ක් වී තිබුණි. |
| (ඇ) | 2012 දෙසැම්බර් 24 දිනැති අංක 49 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | රාජ්‍ය සංස්ථා සේවකයෙකුට ගෙවිය හැකි ප්‍රසාද දීමනා මුදල රු.7,500ක් වුවද අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය නොමැතිව රු.10,000 බැගින් ප්‍රසාද මුදල් වශයෙන් රු.2,263,166 ක් කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබුණු අතර මේ අනුව චක්‍රලේඛ නියමයන්ගෙන් බැහැරව රු.607,500 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |

-

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය බදු අයකිරීමට පෙර රු.67,090,055 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.63,878,705 ක් වූයෙන් මූල්‍ය, ප්‍රතිඵලවල රු.3,211,350 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අමුද්‍රව්‍ය පරිත්‍යාග රු.10,988,882 ක් ලැබීම, ආදායම් බදු රු.12,988,460ක් අඩි වෙන්කිරීම, මූල්‍ය වියදම රු.139,888 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵල වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ සංශෝධිත වාර්ෂික නිෂ්පාදන සැලැස්මෙහි සැලසුම්ගත නිෂ්පාදනය රු.374,149,606 ක් වුවද, තථ්‍ය වාර්ෂික නිෂ්පාදනය රු.239,164,746 ක් විය. ඒ අනුව වාර්ෂික නිෂ්පාදනයෙහි රු.134,984,860 ක අඩුවීමක් සිදුවී තිබුණි.

(ආ) ඇස්තමේන්තුගත හා තථ්‍ය නිෂ්පාදනය සැසඳීමේදී නිෂ්පාදන අයිතම 7ක යහපත් විචලනයක් වූ අතර එය සියයට 20 සිට සියයට 2842 දක්වා පරාසයක විය. නිෂ්පාදන අයිතම 2 ක අහිතකර විචලනයක් වූ අතර එය සියයට 11 ක් හා සියයට 32 ක් වී තිබුණි.

(ඇ) සංස්ථාවේ 2012 වර්ෂයේ ඇස්තමේන්තුගත විකුණුම් තථ්‍ය විකුණුම් හා සැසඳීමේදී අපේක්ෂිත ඉලක්ක අත්පත් කරගෙන නොතිබුණු බව අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

| | ඇස්තමේන්තුගත විකුණුම් | තථ්‍ය විකුණුම් | අහිතකර විචලනය | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| රාජ්‍ය අංශය | 385,488,000 | 395,757,221 | (72,022,779) | 15 |
| පෞද්ගලික අංශය | 82,292,000 | | | |
| සමස්ථ විකුණුම් | 467,780,000 | 395,757,221 | (72,022,779) | 15 |

රාජ්‍ය අංශයට හා පෞද්ගලික අංශයට කරන ලද විකුණුම් වෙන් වෙන්ව ඉදිරිපත් නොකිරීම නිසා එම අංශයන්ගේ ප්‍රගතිය වෙන වෙනම විශ්ලේෂණය කිරීමට නොහැකි විය.

(ඇ) සංස්ථාවේ වාර්ෂික අලෙවිය සලකා බැලීමේදී ක්වාථ, වටිකා, ගුගුල් සහ කල්ක වැනි ඖෂධ අලෙවියෙහි පහළ යාමක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| නිෂ්පාදනයේ නම | විකුණුම් 2012 | විකුණුම් 2011 | වෙනස |
|---|---|---|---|
| | ඒකක | ඒකක | ඒකක |
| ක්වාථ මි.ලී 750 (බෝතල්) | 65,811 | 84,240 | (18,429) |
| වටිකා සහ ගුගුල් (පැකට්) | 57,856 | 61,000 | (3,144) |
| කල්ක (පැකට්) | 65,150 | 81,526 | (16,376) |

(ඉ) **නිකවැරටිය රන්දෙනිගම ඔසු උයන**

2005 අප්‍රේල් මස ආරම්භ කරන ලද අක්කර 54 කින් යුක්ත නිකවැරටිය ඔසු උයන පරීක්ෂා කිරීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(I) ඉඩමට අදාළ සැලැස්මක් සංස්ථාව සතුව නොතිබුණි.

(II) සෑම වර්ෂයකම ආදායම ඉක්මවා වියදම් දරා තිබුණු අතර ඉකුත් වර්ෂ 03 තුළ රු.3,513,844 ක මුදලක් එසේ ආදායම ඉක්මවා වැය කර තිබුණි.

(III) 2010 වර්ෂයේදී ඖෂධ වර්ග 13 ක්ද, 2011 වර්ෂයේදී ඖෂධ වර්ග 28 ක්ද හා 2012 වර්ෂයේදී ඖෂධ වර්ග 48 ක්ද නිකවැරටිය ඔසු උයනෙන් ලැබී තිබුණි. ලැබී ඇති ඖෂධ වර්ගවලින් වැඩි ප්‍රමාණයක් ඔසු උයනේ ඇති ස්ථිර ශාකවලින් ලබාගත් ඖෂධ (නිදසුන් ලෙස කොහොඹ, ආඩතෝඩ, මදුරුතලා, වල්කැප්පෙටියා) වූ අතර කෙටිකාලීන වගාවන් මගින් ලබාගත හැකි ඖෂධ (නිදසුන් ලෙස ලුණුවිල, කහ, කෝමාරිකා, කරවිල) ප්‍රමාණවත් පරිදි ලබාදීම හෝ වගාකිරීම සිදු වී නොතිබුණි.

(IV) උද්‍යානයට අදාළ ඖෂධ වගා සැලැස්මක් නොතිබුණි. වගා බිම තුළ විවිධ ඖෂධ පැලැටි වගා කර තිබුණද එය විධිමත්ව සිදු කර නොතිබුණි.

(V) දීර්ඝකාලීන නොවන ඖෂධ වගාකර තිබුණ අතර ඒවාද ඉතා සුළු කොටස් වශයෙන් තැනින් තැන වගාකර තිබුණි. (නිදසුන් ලෙස කටුවැල් බටු, කෝමාරිකා)

(VI) ඖෂධීය ශාක පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ස්ථානභාර නිලධාරි හට නොතිබුණ අතර ඇතැම් ඖෂධීය ශාක ඔහු විසින් හඳුනාගෙන නොතිබුණි.

(VII) සුලභව ලබාගත හැකි ආඩතෝඩ (අමු) නික කොළ (අමු) කොහොඹ කොළ (අමු) වැනි ඖෂධ පමණක් කිලෝ 500 ක් ඉක්මවා වර්ෂයක් තුළදී ලබාගෙන තිබුණ අතර ඖෂධ වර්ග බොහොමයක් වර්ෂය තුළම ලබාගෙන තිබුණේ එක් වර්ගයකින් කිලෝග්‍රෑම් 10 ත් 100ත් අතර ප්‍රමාණයෙන් විය. (බොහොමයක් ඖෂධ වර්ග කිලෝග්‍රෑම් 50 කට අඩුවෙන් සපයා තිබුණි)

(VIII) ඔසු උයන සතුව වටිනා බෙහෙත් පැලෑටි තිබුණ අතර එම ස්ථාන හඳුනාගෙන නම්කර නොතිබුණ අතර ස්ථිර ඖෂධීය ශාක (නිදසුන් සුදු හඳුන් රත් හඳුන්) ලේඛනවලට ඇතුළත් කිරීම සිදුකර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) බැංකු ගිණුම් සම්බන්ධයෙන් පහත අඩුපාඩු අනාවරණය විය

(I) වසර 15 කට වඩා පැරණි මෙතෙක් හඳුනා නොගත් බැංකුවට බැර නොවූ රු.224,168 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් 2013 නොවැම්බර් 04 දින වන විටත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(II) වසර 20 කට වඩා කාලයක සිට පවතින නිරවුල් නොකල රු.337,010 ක් වටිනා හඳුනා නොගත් ශේෂයන් 2013 නොවැම්බර් 04 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සංස්ථාව සතු යතුරු පැදිය ආදායම් බලපත්‍රය හා රක්ෂණ සහතිකය නොමැතිව භාවිතා කර තිබුණි.

(ඇ) සංස්ථාවට අයත් ඖෂධ උද්‍යාන 4 ක් තුළ ඇති වටිනා ඖෂධ පැල හා වටිනා ගස් වර්ග පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) සංස්ථාවට අයත් බත්තරමුල්ල විභාග මධ්‍යස්ථාන අලෙවිසැල, පිටකොටුව අලෙවිසැල, විජේරාම අලෙවිසැල, ජනකලා කේන්ද්‍රය හා සෙත්සිරිපාය අලෙවිසැල භෞතිකව පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(I) විකිණීමේ හැකියාව හා පාරිභෝගික ඉල්ලුමක් ඇති ඖෂධ වර්ග ගණනාවක් හිඟව පැවතීම. ( නිදසුන් ලෙස රණහංස රසායනය, මී පැණි, ඉරමුසු ටී බෑග්, මධූකා පැණිය, ත්‍රිඵලා පෙති)

(II) ඔසු අලෙවිසැල්වලට 2012 වර්ෂයේදී ලබාදී තිබූ අලෙවි ඉලක්ක ළඟා කර නොගැනීම.

(III) බොහොමයක් අලෙවිසැල් ඖෂධ හා කැඳ ලැබීම් හා නිකුත් කිරීම් පොත් විධිමත් ලෙස පවත්වාගෙන නොතිබීම, කැඳ අලෙවිය සඳහා බිල් ක්‍රමයක් හඳුන්වා දී නොතිබීම හා කැඳ ප්‍රමාණය ගණනය කර ලබා දී නොතිබුණි.

(IV) කල් ඉකුත්වූ ඖෂධ පැවතීම සහ කල් ඉකුත්වන දිනය වැරදි ලෙස මුද්‍රණය කිරීම.

(V) 2012 අගෝස්තු මාසයේ සිට මිළ ගණන්වල සංශෝධනයක් සිදුකර තිබුණත් ඒ සම්බන්ධව අලෙවිසැල් දැනුවත් නොකිරීම සහ ලේබල්වල මිල වෙනස් කිරීමේ ක්‍රමවේදයක් සකස් නොකිරීම.

(VI) සංස්ථාවේ වැඩි අලෙවියක් සිදුවන අලෙවි මධ්‍යස්ථානවල අලෙවිය වැඩි කිරීමටත්, අලාභ ලබමින් පවතින අලෙවි මධ්‍යස්ථානවල පාඩු අවම කිරීමටත් අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමවේදය ශක්තිමත් කර නොතිබීම.

(VII) 2009 සැප්තැම්බර් 25 දින අලෙවිසැල් ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් පත්කරන ලද ත්‍රීපුද්ගල කමිටුව මගින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම.

(VIII) ඖෂධ අලෙවි කිරීමේදී හඳුන්වා දී ඇති වට්ටම් ක්‍රමවේදයේ අඩුපාඩු පැවතීම.

(ආ) 2012 පළමු කාර්තුව තුළ අමුද්‍රව්‍ය හිඟතාවය හේතුවෙන් වැඩපත් 29 ක් අවලංගු කර තිබුණි.

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) පෞද්ගලික ආයතනයකින් මිලදීගත් රු.194,006 ක භාණ්ඩ වෙනුවෙන් එම ආයතනයට ගෙවීම් නොකර සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ ලිඛිත නියෝගය යටතේ පුද්ගලයකුගේ නමට චෙක්පත නිකුත් කර එම චෙක්පත ඔහු විසින්ම ලබාගෙන තිබුණි.

(ආ) සංස්ථාවේ ඖෂධ මිලට ගැනීමේ වෛද්‍ය කමිටුවේ සහ රසායනාගාරයේ නිර්දේශ මගින් ප්‍රතික්ෂේප කරන ලද මී පැණි කි.ග්‍රෑ.4000 ක් එකක් රු.495 බැගින් රු.1,980,000 ක වටිනාකමට පෞද්ගලික ආයතනයකින් 2012 ජුනි 08 දින මිලදී ගෙන තිබුණි.

## 3.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) නිසි නඩත්තුවක් හා අළුත්වැඩියාවකින් තොරව නිකවැරටිය උද්‍යාන භූමියේ වත්කම් දිරාපත් වෙමින් පැවතුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනා ගන්නා ලද භාවිතයට නොගන්නා භාණ්ඩ අයිතම 248 ක් වූ අතර ඒවා අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

-

3.6 **හඳුනා ගන්නා ලද පාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මිලට ගන්නා ලද බෝතල් නොසේදීම නිසා සංස්ථා පරිශ්‍රය තුළ පවතින බෝතල් 25000ක් භාවිතයට ගත නොහැකිව අපහරණය කිරීමට සිදුවී තිබුණි. එම බෝතල් මිලදී ගත් වටිනාකම ආසන්න වශයෙන් රු.250,000 ක් විය.

(ආ) සෙත්සිරිපාය කාර්යාල සංකීර්ණයේ අංක 04 දරන ආපන ශාලාව පවත්වාගෙන යාම වෙනුවෙන් කුලී ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් රු.5,000 ක අධිභාර ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) වැඩපත් අංක 01283115 යටතේ මදුකා කැස්ස පැණිය නිෂ්පාදනය කිරීමේදී සිදු වූ සේවක අකාර්යක්ෂමතාව නිසා සංස්ථාවට රු.233,400ක අලාභයක් සිදුවී තිබුණි.

(ඈ) වැඩපත් අංක 009967 සහ 009979 යටතේ නිපදවන ලද ධාරණී සිරප් බෝතල් තුළින් දුර්ගන්ධයක් පැමිණීම හේතුවෙන් අලෙවියෙන් බැහැර කර තිබූ ඖෂධවල වටිනාකම රු.65,720 ක් විය.

3.7 **ප්‍රමාද වූ ව්‍යාපෘති**

රජරට නිෂ්පාදනාගාරය ඉදිකිරීම ආරම්භ කර අතරමග නවතා දමා තිබුණි. ඒ සඳහා 2010 වර්ෂයේදී රු.1,775,095 ක් වැය කර තිබුණි.

3.8 **වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්**

2012 ඔක්තෝබර් 12 දිනැති වවුචර් අංක 226/10/2012 මගින් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සඳහා නවදිල්ලි නුවර ලෝක සෞඛ්‍ය සංවිධාන කාර්යාලයක් ආරම්භ කිරීමට රු.3,000,000 ක මුදලක් ලබාදී තිබුණි. එහි ප්‍රගතිය සම්බන්ධයෙන් කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

4.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සංස්ථාව විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ 2013 ජුනි 19 දීය. මේ අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය මාස 03ක් වී තිබුණි.

**4.2** ක්‍රියාකාරී සැලැස්ම

2012 වර්ෂයට අදාළ සංස්ථාවේ ක්‍රියාත්මක සැලැස්මට අනුව සකස් කරන ලද ප්‍රගතිය දැක්වෙන වාර්තාවක් විගණනයට ඉදිරිපත් නොවූ හෙයින් ක්‍රියාකාරී සැලැස්මේ හා සංයුක්ත සැලැස්මේ දක්වා තිබුණු ඉලක්කයන් ඉටුකළ ප්‍රමාණයන් තක්සේරු කිරීමට නොහැකි විය.

**5.** **<u>පද්ධති හා පාලනයන්</u>**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගබඩාකරණය හා තොග පාලනය

(ආ) පිරිවැයකරණය

(ඇ) දිරිදීමනා

(ඈ) ගිණුම්කරණය - මෘදුකාංග භාවිතය

(ඉ) විකුණුම් - අලෙවි මධ්‍යස්ථාන විකුණුම්

(ඊ) වාහන